# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 378/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 03/03/2024<br>පැය 2245 |

## මාධ්‍ය නිවේදනය

**අයිස් මත්ද්‍රව්‍ය කිලෝ 09 ග්‍රෑම් 307 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු සහ සැකකාරියක් අත්අඩංගුවට ගැනීම - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි ඒකකය.**

යුක්තිය මෙහෙයුමට සමගාමීව පොලිස් විශේෂ කාර්ය බලකා නිළධාරීන් විසින් දෛනිකව සිදු කරනු ලබන වැටලීම් අතරතුර 2024.03.02 වන දින දහවල් කාලයේ කිරිබත්ගොඩ පොලිස් වසමේ දළුගම ප්‍රදේශයේදී, පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය කිලෝ 05 ග්‍රෑම් 25 ක්** කාර් රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු එම කාර් රථය හා ජංගම දුරකථන දෙකක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 59 ක් වූ දඹුල්ල පාර, කුරුණෑගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම අයිස් මත්ද්‍රව්‍ය තොගය චොකලට් බහාලන කාඩ්බෝඩ් ඇසුරුම්වල ඉතා සූක්ෂම ආකාරයෙන් සඟවා තිබී ඇත. මෙම සැකකරුගෙන් අනාවරණය වූ තොරතුරු මත 2024.03.02 වන දින රාත්‍රී කාලයේ කටුනායක පොලිස් වසමේ 18 කණුව ප්‍රදේශයේදී තවත් සැකකටයුතු කාර් රථයක් පරීක්ෂා කර එහි ගමන් කරමින් සිටි සැකකරුවෙකු හා සැකකාරියක් **අයිස් මත්ද්‍රව්‍ය කිලෝ 03 ග්‍රෑම් 16 ක්** හා එම කාර් රථය සමඟ අත්අඩංගුවට ගෙන ඇත. එම සැකකරුවන්ගෙන් අනාවරණය වූ තොරතුරු මත ඔවුන් නවාතැන් ගෙන සිටි කටුනායක ප්‍රදේශයේ හෝටලයක කාමරයක් තුළ තිබී තවත් **අයිස් මත්ද්‍රව්‍ය කිලෝ 01 ග්‍රෑම් 266 ක්, සොයාගෙන ඇත. තවද සැකකරුවන් විසින් මත්ද්‍රව්‍ය කිරාමැන බැලීම සඳහා භාවිතා කරන ලද විද්‍යුත් තරාදි දෙකක්, සැකකරුවන්ට අයත් ජංගම දුරකථන 05 ක් හා විදේශ ගමන් බලපත්‍ර දෙකක්** විමර්ශන නිලධාරීන් භාරයට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් එම සැකකරු වයස අවුරුදු 33 ක් වන හෙම්මාතගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර සැකකාරිය වයස අවුරුදු 41 ක් වන කටුනායක ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෙම මත්ද්‍රව්‍ය තොගය ඉන්දියාවේ සිට ගුවන් මගින් මෙරටට රැගෙන පැමිණ ඇති බවට හා සැකකරුවන් විසින් දීර්ඝ කාලයක් තිස්සේ මෙම මත්ද්‍රව්‍ය ජාවාරම සිදු කර ඇති බවට සැක

කරනු ලබන අතර වත්තල පොලිස් වසමේ වැලිඅමුණ මාර්ගයේ හා කඩවත පොලිස් වසමේ ගණේමුල්ල මාර්ගයේ පිහිටි සුඛෝපභෝගී නිවාස දෙකක් මෙම මත්ද්‍රව්‍ය ජාවාරම සිදුකිරීමට සහ ඔවුන්ගේ ආරක්ෂාව සඳහා යොදාගෙන ඇති බවට නිරීක්ෂණය වී ඇත. මෙම එක් නිවසක පිහිණුම් තටාකයක්ද, තිබී ඇති අතර එම නිවාස දෙක සම්බන්ධව නීති විරෝධි වත්කම් විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් විසින් වැඩිදුර විමර්ශන සිදු කිරීමට නියමිතව ඇත.

අත්අඩංගුවට ගත් අයිස් මත්ද්‍රව්‍ය තොගයේ වටිනාකම රුපියල් කෝටි 10 කට අධික බවට විමර්ශන නිලධාරීන් විසින් සඳහන් කර ඇති අතර සැකකරුවන් දෙදෙනා සහ සැකකාරිය වැඩිදුර විමර්ශන සඳහා පොලිස් මත්ද්‍රව්‍ය විමර්ශන කාර්යංශය වෙත ඉදිරිපත් කර ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**